**කතරගම ප්‍රාදේශීය සභාව - 2022**

**--------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කතරගම ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය,ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය,වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කතරගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේමූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන

තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවයමෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත්කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත .

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 සහ 2021 වර්ෂවල කඩා ඉවත් කරන ලද වටිනාකම රු.490,000 ක් වූ ගොඩනැගිලි 09 ක් සහ භෞතිකව පැවැත්ම තහවුරු නොවුණු වටිනාකම රු.2,480,000 ක ගොඩනැගිලි 06 ක් වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | කඩා ඉවත් කරන ලද ගොඩනැගිලි වෙනුවට මේ වන විට නව ගොඩනැගිලි ඉදිකරමින් පවතින බැවින් එම වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත්ව පැවතීම දෝෂ සහගත නොවන බව පෙන්වා දෙන අතර ඉදිරියේදී එම දේපල සම්බන්ධව සොයා බලා මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීමට අවධානය යොමු කරවමි. | සභාව සතු වත්කම්වල භෞතික පැවැත්ම තහවුරු කරගත යුතු අතර කඩා ඉවත් කරන ලද ගොඩනැගිලිවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කළ යුතුය. |
| (ආ) | මුදල් පොත අනුව බැංකු ශේෂය රු.743,312 ක් වුවත් එය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ රු.524,469 ක් වශයෙන් දක්වා තිබුණි. | මෙය වසර ගණනාවක සිට පැවත එන දෝෂයකි.ඉදිරියේදී මෙම වෙනසට හේතු වූ කරුණු සොයා බලා නිවැරදි කිරීමට බලාපොරොත්තු වෙමි. | නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කළ යුතුය. |
| (ඇ) | 2022 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු සම්ප්‍රේෂණ කුළුණු ගාස්තුව රු.60,000 ක් ගිණුම්ගතකර නොතිබුණි. | 2022 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු සම්ප්‍රේෂණ කුළුණු ගාස්තු මූල්‍ය ප්‍රකාශනය තුල ගැළපීමට කටයුතු කරමි. | ලැබිය යුතු ආදායම් මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව ගිණුම්ගතකළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වර්ෂය තුල ශුද්ධ මුදල් චලනය දක්වා නොතිබුණු අතර වර්ෂය ආරම්භයේ පැවති මුදල් හා මුදල් සමාන දෑ හි වටිනාකම ඇතුලත් කර මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුලනය කර නොතිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීම පිළිබඳව තවදුරටත් අධ්‍යයනය කර ඉදිරි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරගැනීමට බලාපොරොත්තු වෙමි. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනයේ ඇතුළත් වර්ෂයේ උසාවි දඩ ආදායම රු. 302,401 ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි. | මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනයේ උසාවි දඩ ආදායම් අඩුවෙන් ගිණුම්ගත වීම නිවැරදි කර ගැනීමට බලාපොරොත්තු වෙමි. | සියලුම ආදායම් මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව ඇතුලත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | 2022 වර්ෂයේ මිලදී ගත් රු.622,400 ක සහ පරිත්‍යාග ලෙස ලද රු.189,031 ක පුස්තකාල පොත් වටිනාකම මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ රු.436,957 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | පුස්තකාල පොත් වටිනාකම මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ අඩුවෙන් ගිණුම්ගත වීම නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි වටිනාකම් ඇතුලත් කළ යුතුය. |
| (උ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දැන්වීම් පුවරු ගාස්තු ආදායම් රු.766,800 ක් ගිණුම්ගත කර නොතිබුණු අතර මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ලැබිය යුතු දැන්වීම් පුවරු ගාස්තු රු.598,850 ක් අඩුවෙන් දක්වා තිබුණි. | සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු දැන්වීම් පුවරු ගාස්තු ආදායම් ගිණුම් ගත නොකිරිම නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. | සභාව සතු සියලුම ආදායම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කළ යුතුය. |
| (ඌ) | ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂය තුල සභාවට ලද රු.26,175,958 ක මුදලක් හා ඉන් වැයකරන ලද රු. 23,265,087 ක් 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කරන ලද මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනයට ඇතුලත් කර නොතිබුණි. | මේ සම්බන්ධව ඉදිරියේදී පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙතින් උපදෙස් ලබා ගැනීමට කටයුතු කර එම උපදෙස් පරිදි අවසන් ගිණුම්වලට ඇතුලත් කරන්නේද නැද්ද යන්න තීරණය කිරිමට බලාපොරොත්තු වෙමි. | සභාව සතු සියලු ආදායම්, වියදම් වත්කම්, වගකීම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කළ යුතුය. |
| (එ) | සමාලෝචිත වර්ෂයට අදාලව ලැබී තිබුණු මුද්දර ගාස්තු ආදායම රු.195,455 ක් අඩුවෙන් මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනයේ දක්වා තිබුණි. | සමාලෝචිත වර්ෂයට අදාලව ලැබී තිබුණු මුද්දර ගාස්තු ආදායම අඩුවෙන් දැක්වීම නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. | නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කළ යුතුය. |
| (ඒ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු කඩ කුලී ආදායම් රු.137,395 ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි. | ලැබිය යුතු කඩ කුලී ආදායම් අඩුවෙන් ගිණුම්ගත කිරීම ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. | නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කළ යුතුය. |
| (ඔ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තොග ලේඛනය අනුව පැවති රු.151,356 ක් වටිනා වර්ග 08 කට අයත් ඒකක 326 ක් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කර නොතිබුණි. | මෙම දෝෂය නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. | අවසන් තොග ශේෂය නිවැරදිව ගණනය කළ යුතුය. |

**1.6.2 නොසැසඳුණු ගිණුම් ශේෂ**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ජංගම වගකීම් රු.90,667,097 ක් ලෙස දක්වා තිබුණද ඊට අදාල සටහන් අංක 13 යටතේ ශේෂයන්ගේ එකතුව රු.28,602,901 ක් විය. | මේ පිළිබඳ අධ්‍යයනය කර නිවැරදි කරගැනීමට කටයුතු කරමි. | තවදුරටත් නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය අනුව සභාවේ හිමිකම් රු.353,276,875 ක් වුවද මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ එය රු. 290,960,352 ක් ලෙස දක්වා තිබුණි. | එම | එම |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ඉදිකරන ලද සහ වැඩි දියුණු කරන ලද ගොඩනැගිලිවල නිම්වැඩ වටිනාකම රු.28,259,182 ක් වුවත් එය දේපල පිරියත උපකරණවල ඉඩම් හා ගොඩනැගිලි යටතේ රු.22,607,732 ක් ලෙස දක්වා තිබුණි. | සමාලෝචිත වර්ෂයේ ඉදිකරන ලද ගොඩනැගිලිවල වටිනාකම ප්‍රාග්ධනිත කිරිමට කටයුතු කරමි. | සභාව සතු වත්කම්වල අගය නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතුය. |
| (ඈ) | සභාවේ වරිපනම් බදු මෘදුකාංග පද්ධතිය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වරිපනම් බදු ශේෂය රු.19,141,070 ක් වුවත් එය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ රු.18,506,012 ක් ලෙස දක්වා තිබුණි. | වරිපනම් බදු මෘදුකාංග පද්ධතිය යාවත්කාලීන වී නොතිබුණු අතර මේ වනවිට මෙම මෘදුකාංගයට දත්ත ඇතුලත් කරමින් පවති. එය නිවැරදි කර ගැනීමෙන් අනතුරුව විගණනය වෙත ඉදිරිපත් කිරිමට කටයුතු කරමි. | නිවැරදි වටිනාකම් මත පදනම්ව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ඉ) | මුද්දර තැන්පත් ලේඛනය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ශේෂය ලෙස රු.9,600 ක් පැවතුණද මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ එය රු.304,501 ක් ලෙස දක්වා තිබුණි. | මුද්දර තැන්පතු සම්බන්දව විගණනය විසින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා 2016 වසරේ සිට නැවත ගණනය කිරීම සිදු කළ අතර 2022 දෙසැම්බර් 31 දිනට අදාල මුද්දර තැන්පත් ශේෂය සංශෝධනය විය යුතු ය. | මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කරන වටිනාකම් ලේඛන හා උපලේඛනවල ඇති වටිනාකම් සමඟ සමාන විය යුතුය. |

### 1.6.3 අධිකාරී බලය නොලත් ගණුදෙනු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 වර්ෂයේ ජනවාරි සිට අප්‍රේල් දක්වා කාල සීමාවට අදාලව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා භාවිතා කරන කැබ්රථය සඳහා මාසයකට අනුමත ඉන්ධන සීමාව වූ ලීටර් 400 ඉක්මවා රු.369,058 ක ඉන්ධන ලීටර් 2134 ක් භාවිතා කර තිබුණි. | මේ සම්බන්ධව පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් විමර්ශනයක් සිදු කළ අතර එම විමර්ශන වාර්තාව අනුව කටයුතු කිරිමට බලාපොරොත්තු වෙමි. | වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන අයකර ගැනීම් කළ යුතුයි. |
| (ආ) | ප්‍රාදේශීය සභාවට අයත් රථගාල්වලින් ගාස්තු එකතු කිරීම සඳහා බාහිර පුද්ගලයන් යොදවාගෙන තිබුණු අතර 2019 ජුනි සිට 2021 අප්‍රේල් දක්වා කාල පරිච්ඡේදයට අදාලව එකතු කරන මුදලින් එම පුද්ගලයන්ට රු.1,733,194 ක් කොමිස් මුදල් ලෙස ගෙවා තිබුණු නමුත් කොමිස් පදනම මත පුද්ගලයන් බඳවා ගැනීම සඳහා අනුමැතියක් ලබාගෙන නොතිබුණි. | වසර ගණනාවක සිට මෙලෙස සභාව සතු රථගාල්වලින් ගාස්තු අයකිරීම සිදු කළද ඒ සඳහා අනුමැතියක් ලබාගෙන නොතිබුණු අතර ඉදිරියේදී නැවත බඳවා ගැනීම් සිදු කරන්නේ නම් විධිමත් අනුමැතියක් මත බඳවා ගැනීමට බලාපොරොත්තු වෙමි. | විධිමත් අනුමැතිය යටතේ පුද්ගලයන් බඳවාගෙන සේවය ලබාගත යුතුයි. |

### 1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතු වටිනාකම රු. 217,225,826 ක් වූ ගිණුම් ශේෂ 12 ක් සම්බන්ධයෙන් වෘත්තීය තක්සේරුකරුවන්ගේ වාර්තා, ස්ථාවර වත්කම් ලේඛන, කාල විශ්ලේෂණ වාර්තා සහ යාවත්කාලීන කරන ලද ලේඛන සහ උපලේඛන ඉදිරිපත් කර නොතිබුණු බැවින් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | ඉදිරියේදී අදාල ලේඛන හා උපලේඛන නිවැරදි කිරීමටත්, යාවත්කාලීනව පවත්වාගෙන යාමටත් කටයුතු කරන බව දන්වමි. | මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් වත්කම් හා වගකීම් ශේෂයන් තහවුරු කිරීම සඳහා ලේඛන හා උපලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යා යුතුයි. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) <u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය</u> | | | |
| (i) මුදල් රෙගුලාසි 104(3),(4 | සභාව සතු කෘa කැබ් රථය 2022 මාර්තු 30 දින අනතුරට පත්ව තිබුණු අතර 2022 නොවැම්බර් 30 දින වන විටත් ඒ පිළිබඳ පූර්ණ වාර්තාවක් එය ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී මෙවැනි අඩුපාඩු ඇති නොවීමට අදාලව කටයුතු සිදුකරන බව දන්වමි. | අලාභ හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුයි. |
| (ii) මුදල් රෙගුලාසි 396(ඈ) | සභාව විසින් කල් ඉකුත් වූ රු. 88,356 ක් වටිනා චෙක්පත් 09 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කර නොතිබුණි. | කල් ඉකුත් වූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කිරිමට බලාපොරොත්තු වෙමි. | කල් ඉකුත් වූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුයි. |
| (iii) මුදල් රෙගුලාසි 1646 | 2022 වර්ෂයට අදාලව සභාව සතු වාහන 20 ක් සම්බන්ධයෙන් ධාවන සටහන් ඉදිරිපත් කර නොතිබුණි. | සභාව සතු වාහන සම්බන්ධයෙන් 2022 වර්ෂයට අදාළ ධාවන සටහන් හා මාසික සාරාංශ විගණකාධිපති වෙත කඩිනමින් ඉදිරිපත් කිරිමට බලාපොරොත්තු වෙමි. | වාහනවලට අදාල ධාවන සටහන් හා මාසික සාරාංශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ආ) ඌව පළාත් සභාවේ අංක 4/HRM/2/ වා.ස්.මා/2018 හා 2017 ජුනි 30 දිනැති චක්‍රලේඛයේ 5.2.5 (ආ) II වගන්තිය | වසර 5 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සියලුම නිලධාරීන් ස්ථාන මාරුවීම්වලට අනිවාර්යෙන්ම යටත්විය යුතු නමුත් වසර 7 සිට 17 දක්වා සේවය කරන නිලධාරීන් 10 දෙනෙකු ස්ථාන මාරුකර නොතිබුණි. | 2023 වාර්ෂික ස්ථානමාරු මණ්ඩල නියෝග අනුව තීරණ ක්‍රියාත්මක කිරීමට නියමිතව ඇත. | වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සියලුම නිලධාරීන් වාර්ෂික ස්ථාන මාරුවීම්වලට යටත්විය යුතුයි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 11,925,420 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 12,580,070 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 රැස්කළ ආදායම් හා හිඟ ආදායම් ,බිල්කළ ආදායම් ,ආදායම් ඇස්තමේන්තුගත**

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 9,210,807 | 9,210,807 | 3,252,278 | 5,958,529 | 9,210,807 | 8,143,158 | 3,464,490 | 4,678,668 |
| (ii) | කුලී | 18,263,500 | 18,263,500 | 1,307,542 | 16,955,958 | 17,858,200 | 5,602,106 | 1,079,805 | 4,522,301 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,230,500 | 372,250 | 372,250 | - | 3,101,700 | 532,050 | 532,050 | - |
| (iv) | වෙනත් ආදායම් | 30,210,125 | 98,655,285 | 62,483,130 | 36,172,155 | 28,274,250 | 19,404,169 | 12,618,081 | 6,786,088 |
| | එකතුව | 59,914,932 | 126,501,842 | 67,415,200 | 59,086,642 | 58,444,957 | 33,681,483 | 17,694,426 | 15,987,057 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ බිල්කරන ලද රු.126,501,842 ක් වූ මුළු ආදායමෙන් වර්ෂය අවසාන වන විට රු.59,086,642 ක් අයකරගෙන නොතිබුණු අතර එය මුළු බිල්කල ආදායමෙන් සියයට 47 ක් විය. | වර්ෂයට අදාළ හිඟ ආදායම් අයකරගැනීමට කටයුතු කරමි. | වාර්ෂික බිල්කළ ආදායම අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා බිල්කරන ලද වරිපනම් බදු රු. 6,293,052 ක ආදායමෙන් වර්ෂය තුල දී රු.1,582,317 ක් අයකරගෙන තිබුණි.ඒ අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වරිපනම් බදු රු.4,590,865 ක් තව දුරටත් අයවිය යුතුව පැවතුණි. එය බිල්කල ආදායමෙන් සියයට 73 ක ප්‍රතිශතයක් විය. | රටේ පැවති අයහපත් ආර්ථික තත්ත්වය හේතුවෙන් අයකර ගැනීමට නොහැකි වූ වරිපනම් බදු ආදායම් ඉදිරියේදී අයකර ගැනීමට බලාපොරොත්තු වෙමි. | වාර්ෂික බිල්කළ ආදායම අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ සභාව සතු දේපළ 19 ක් බදුදීම වෙනුවෙන් ලැබිය යුතු රු.13,380,425 ක් වූ ටෙන්ඩර් දේපල බදු ආදායමෙන් 2022 දෙසැම්බර් 31 දිනට රු.10,756,096 ක් අයකරගෙන නොතිබුණි. ඒ අනුව ටෙන්ඩර් දේපල බදු ආදායම අයවීමේ ප්‍රතිශතය සියයට 20 ක පහළ ප්‍රතිශතයක් විය. | සභාව සතු දේපළ බදු දීම වෙනුවෙන් ලැබිය යුතු හිඟ ආදායම් අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට බලාපොරොත්තු වෙමි. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ බදු දී තිබුණු කඩ කාමර 11 කින් අයවිය යුතු රු. 4,522,800 ක් වූ කඩ කාමර ආදායමෙන් 2022 දෙසැම්බර් 31 දිනට රු. 3,956,300 ක කඩ කාමර කුලී අයකරගත යුතුව පැවතුණි. එය මුළු බිල් කළ ආදායමෙන් සියයට 87 ක් විය. | කඩ කාමරවලින් අයවිය යුතු හිඟ මුදල් අයකර ගැනීම සඳහා ඉදිරියේදී නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට බලාපොරොත්තු වෙමි. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| (ඉ) | සභා බලප්‍රදේශය තුල විවිධ ආයතන/පුද්ගලයින් විසින් ප්‍රදර්ශනය කර තිබුණු ස්ථාවර ප්‍රචාරක දැන්වීම් පුවරු 67 කින් ඉකුත් වර්ෂයට සහ සමාලෝචිත වර්ෂයට අදාලව අයවිය යුතු රු.766,800 ක් 2022 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි. | ස්ථාවර ප්‍රචාරක දැන්වීම් පුවරු වලට අදාලව අයවිය යුතු ආදායම් අයකර ගැනීමට මේවන විටත් ආයතන/පුද්ගලයින් දැනුවත් කර ඇති අතර එම ආදායම අයකරගැනීමට බලාපොරොත්තු වෙමි. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභා බලප්‍රදේශය තුල ස්ථාපිත කර තිබුණු දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 09 කින් අයවිය යුතු රු. 60,000 ක බලපත්‍ර ආදායම් අයකර ගෙන නොතිබුණි. | අදාල මුදල් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවති. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.472,086 ක් සහ මුද්දර ගාස්තු රු.2,304,515 ක් ගෙන්වා ගෙන නොතිබුණි. | ලැබිය යුතුව තිබුණු උසාවි දඩ මුදල් මේවන විට අයකරගෙන ඇති අතර මුද්දර ගාස්තු අය කර ගැනීමට කටයුතු කරමි. | සභාව වෙත ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකරගත යුතුය. |
| (ඌ) | බස් නැවතුම්පොළ භූමියේ පිහිටි නව පොදු වැසිකිළිය 2022 ජනවාරි 01 දින සිට වර්ෂයක් සඳහා රු. 825,000 කට පළමු වරට බදු දී තිබුණු නමුත් අදාල බදුකරු විසින් 2022 නොවැම්බර් 30 දින දක්වා මුදල් ගෙවීම් සිදුකර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගෙන බදු අයකරගැනීමට බලාපොරොත්තු වෙමි. | හිඟ ආදායම් අයකරගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටුකිරීම**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන්, ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාව විසින් ලබාදී තිබුණු පාරිසරික ආරක්ෂණ බලපත්‍ර 07 ක වලංගු කාලය ඉකුත්වී තිබුණු නමුත් එම බලපත්‍ර අලුත්කිරීමට කටයුතුකර නොතිබුණු අතර ඒ අනුව සභාව විසින් බලප්‍රදේශයේ පවත්නා කර්මාන්ත නියාමනයකට ලක්කර නොමැති බව නිරීක්ෂණය විය. | එම කර්මාන්ත මේ වන විට වසා දැමීමට නියමිත බැවින් ඒ සම්බන්ධව නැවත පරික්ෂාකර බලා වාර්තාවක් විගණනය වෙතද ලබා දීමට බලාපොරොත්තු වෙමි. | සභා බලප්‍රදේශයේ පවත්නා කර්මාන්ත නියාමනයකට ලක්කළ යුතුය. |
| (ආ) | සභාව තුල ගිනි නිවීමේ ඒකකයක් ස්ථාපිත කර තිබුණද ජල මෝටරය ස්වයංක්‍රීයව පනගැන්විය නොහැකිවීම සහ ආරක්ෂක නිල ඇඳුම් නොමැතිවීම හේතුවෙන් ආරක්ෂිතව වඩාත් කාර්යක්ෂම සේවාවක් ලබාදීමට නොහැකි වී තිබුණි. | මෙම මෝටරය ස්වයංක්‍රීයව පනගැන්විය නොහැකි වුවද එය ඉතා සුළු කාලයක් තුල පනගැන්වීමේ හැකියාව පවතින බැවින් ගිනි නිවීමේ කටයුතු සඳහා ස්වයංක්‍රීයව පණගැන්වීමට නොහැකි වීම බාදාවක් වී නොමැත. ගිනි නිවීමේ ඒකකයේ සියළු කාර්ය මණ්ඩලයට 2022 වර්ෂය සඳහා නිල ඇඳුම් ලබා දී ඇත. | ජල මෝටරය ස්වයංක්‍රීයව පනගැන්විය හැකි පරිදි සකස්කරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කතරගම පූජා භූමි සංවර්ධන කමිටුවේ තීරණය පරිදි ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් 2020 ජූලි 16 දින සිට වසර 5 කට කතරගම පූජා භූමිය නව වැසිකිලි පද්ධතිය පවත්වාගෙන යාම සඳහා කතරගම ප්‍රාදේශීය සභාවට පවරා දී තිබුණද 2022 නොවැම්බර් 30 දින වන විටත් මෙම දේපල බදු දීමට කටයුතු කර නොතිබුණි. | කතරගම පූජා භූමිය නව වැසිකිලි පද්ධතිය බදු දීම සඳහා විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේදය ඔස්සේ ටෙන්ඩර් කරුවෙකු තෝරාගත් නමුත් රුහුණු මහ කතරගම දේවාලයේ පාලන අධිකාරිය විසින් එහි ටෙන්ඩර් කරු වෙත එම වැසිකිලිය පවත්වාගෙන යැමට බාධා සිදු කර ඇත.මේ සම්බන්ධයෙන් අවස්ථා කිහිපයකදීම එම පාලන අධිකාරිය හා එකඟතාවයකට පැමිණීමට උත්සාහ කලද එය අසාර්ථක වී ඇත.එහි ටෙන්ඩර් ගාස්තුව ගෙවන ලෙස ලිඛිතව දැනුම් දී ඇති නමුත් එයද ඉටු වී නැත. | සභාව සතුව පවතින දේපල බදු දී ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 -2021 කාල පරිච්ඡේදය තුල කාර්යාලයේ නිලධාරීන් නොවන බාහිර පුද්ගලයින් 03 දෙනෙකු වෙත ආදායම් එකතු කිරිම සඳහා අවස්ථා 12 කදී උපපත්‍රිකා පොත් 12 ක් ලබාදී තිබුණු අතර එම පොත් නැවත ලබා ගැනීමට හෝ අදාල මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආදායම් එකතු කිරිම සඳහා බාහිර පුද්ගලයින් වෙත ලබා දී තිබූ උපපත්‍රිකා පොත් 12න් 2ක් සඳහා මුදල් අයකරගත් අතර ඉතිරි අය සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට මේ වන විටත් කටයුතු කර ඇත. | දීර්ඝ කාලයක සිට බාහිර පුද්ගලයන්ට නිකුත් කර ඇති උප පත්‍රිකා පොත් කඩිනමින් සභාව වෙත ලබාගත යුතුය. |

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව විසින් අවසන්වරට 2012 වර්ෂයේදී වරිපනම් බදු තක්සේරුව සිදුකර තිබුණු අතර කාලීනව තක්සේරුකිරීම් සිදුකර නොතිබුණි. | වරිපනම් බදු තක්සේරුව කිරිම සඳහා මේවන විට නිළධාරින් හට පුහුණුව ලබා දී ඇති අතර හැකි ඉක්මනින් වරිපනම් බදු තක්සේරුව සිදු කිරිමට කටයුතු කරමින් පවති. | වරිපනම් බදු තක්සේරුව කාලීනව සිදුකළ යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ අයිතිකරු නිශ්චිතව හඳුනා නොගත් වරිපනම් ඒකක ගණන 885 ක් වූ අතර අයිතිකරුවන් හඳුනාගෙන හිඟ වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ වරිපනම් කඩිනමින් අයකර ගැනීමට බලාපොරොත්තු වෙමි. | හිඟ වරිපනම් බදු අයකර ගැනිමට කටයුතු කළ යුතුය. |

### 3.4 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවට පැමිණෙන ගණුදෙනුකරුවන්ට අවශ්‍ය අයදුම්පත්‍ර ස්වයංක්‍රියව මුද්‍රණය කර ගැනීම සඳහා ලබා දී තිබුණු යන්ත්‍රයක් ලබාදුන් දින සිට අදාල කාර්ය සඳහා භාවිතා නොකර නිශ්කාර්යව පැවතුණි. | මෙම යන්ත්‍රය භාවිතයට ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවති. | සභාව සතු වත්කම් උපරිම කාර්යක්ෂමතාවයෙන් ප්‍රයෝජනයට ගත යුතුය. |
| (ආ) | කතරගම ප්‍රාදේශීය සභාවේ විශ්‍රාමශාලාව සඳහා 2019 පෙබරවාරි 27 දින මිලදී ගෙන තිබුණු රු. 28,000 ක් වූ කෑම මේසයක් සහ 2021 ජනවාරි 01 දින ප්‍රාදේශීය සභාවට පරිත්‍යාග ලෙස ලැබී තිබුණු ලීටර් 2000 (Blue tech) ප්ලාස්ටික් වතුර ටැංකි 10 ක් 2022 ජුනි 08 දින වන විට අස්ථානගතවී තිබුණි. | ඌණ භාණ්ඩ සම්බන්ධව පත් කර ඇති කමිටුවේදී මෙම ඌණතාවයන් පිළිබඳවද සළකා බැලීම සිදුවන බැවින් කමිටු වාර්තා පරිදි කටයුතු කිරිමට බලාපොරොත්තු වෙමි. | වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන අලාභ අයකරගත යුතුයෙ. |
| (ඇ) | සභාව විසින් 2021 නොවැම්බර් මස සිදුකර තිබුණු ක්ෂේත්‍ර පරීක්ෂණය අනුව ප්‍රාදේශීය සභාවට අයත් යැයි හඳුනාගෙන තිබුණු සුසාන භූමි 08 ක, ප්‍රජාශාලා 11 ක, ඉඩම් 02 ක හා ගොඩනැගිලි 23 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගතකර නොතිබුණි. | මෙම වත්කම් හැකි ඉක්මනින් තක්සේරු කර ගිණුම්ගත කිරිමට කටයුතු කරමි. | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |

### 3.5 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ තනතුරු 12 කට අදාලව පැවති අනුමත කාර්ය මණ්ඩලය අනුව වූ සේවක පුරප්පාඩු 18 ක් පුරවා නොතිබුණි. | රාජ්‍ය ප්‍රතිපත්තියක් ලෙස නව බඳවාගැනීම් අත්හිටුවා ඇත. | සේවක පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 1995 අප්‍රේල් සිට 2000 දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදයට අදාලව සේවක අර්ථසාධක අරමුදල් නොගෙවීම මත රු. 40,382 ක හිඟ මුදලක් සහ රු.20,191 ක අධිභාර මුදලක් ගෙවීමට සිදු වී තිබුණි. | මෙම කාලච්ඡේදය ඉක්ම වී වසර 23ක් ගත වී ඇති බැවින් මීට අදාළ තොරතුරු සහ වගකිව යුතු නිළධාරින් හඳුනාගත නොහැක. අධිකරණ ක්‍රියාමාර්ග හේතුවෙන් ගෙවීමට සිදු විය. | වැටුපෙන් සිදු කරනු ලබන අවකරණයන් කාලීනව සිදුකර අදාල ආයතන වෙත ප්‍රේෂණය කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභාවේ අභ්‍යන්තර විගණන කටයුතු සඳහා අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත්කර තිබුණද, 2022 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන වාර්තාවන් ඉදිරිපත් කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන නිළධාරියෙකු පත් කළද,කාර්යමණ්ඩල ඌණතා හේතුවෙන් ඔහු වෙනත් රාජකාරි සඳහා යෙදවීමට සිදුවිය.ඉදිරියේදී මෙම තත්වය නිවැරදි කර ගැනීමට බලාපොරොත්තු වෙමි. | සභාවේ අභ්‍යන්තර විගණන කටයුතු සඳහා නිලධාරියෙකු පත්කර ඔහුගෙන් අදාල කාර්යය කාර්යක්ෂමව ඉටුකරවා ගතයුතුයි. |

### 4.2 විගණන කමිටුව

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41(1) වගන්තිය සහ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවෙහි චක්‍රලේඛ අංක ඩීඑම්ඒ/01-2019 දරන 2019 ජනවාරි 12 දිනැති අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි. | පළාත් පාලන ආයතනයන්හි පැවැත් වූ විගණන හා කළමනාකරණ කමිටුවලට සහභාගී වූ අතර මෙම වර්ෂයේදී කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු වෙහි චක්‍රලේඛනය ප්‍රකාරව විගණන කමිටු පැවැත්වීමට බලාපොරොත්තු වෙමි. | ජාතික විගණන පනත සහ අනෙකුත් චක්‍රලේඛ පරිදි කටයුතු කළ යුතුයි. |

### 4.3 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රාදේශීය සභාව විසින් පිළියෙලකර තිබුණු අයවැය ලේඛනය මගින් ඇස්තමේන්තු කළ ආදායම් හා වර්ෂයේ තථ්‍ය ආදායම් අතර සියයට 11 සිට සියයට 100 දක්වා ද, ඇස්තමේන්තු කළ වියදම් හා වර්ෂයේ තථ්‍ය වියදම් අතර සියයට 17 සිට සියයට 96 දක්වා සැලකිය යුතු විචලනයන් පවතින බැවින් ආදායම් හා වියදම් පාලනයේදී අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි. | රටේ පැවති කොවිඩ් වසංගත තත්වය,ආර්ථික දුෂ්කරතා,ඉන්ධන නොමැතිකම, ආදී කරුණු හේතුවෙන් සැළසුම් කල ආකාරයෙන් ක්‍රියාත්මක කිරිමට නොහැකි විය. | නිවැරදි අයවැය ලේඛනයක් පිළියෙල කර එහි දක්වා ඇති ඉලක්ක සපුරාගත යුතුය. |